අකුසල සිත් ගැන කථා කරනවිට සොමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත යෙහි “දිට්ඨි” යනු

මිථ්‍යා දිට්ඨියයි. එනම් 1. අනුසය - * කාමරාග /භවරාග / පටිඝ /දිට්ඨි/ අවිජ්ජා 2. ආසව -*කාමාසව/ භවාසව/ දිට්ඨි ආසව /අවිජ්ජා ආසව

3. උපාදන -* කාම උපාදන /දිට්ඨි උපාදන /සීලබ්බත උපාදන/අත්තවාද උපාදන සහිත වීමයි.

සසංඛාර අසංඛාර භේදය. - අනුබල දීම සහ අනුබල නොදීම මෙයින් අදහස් කරයි .අනුබල දුන්මුත් කැමැත්තේ කිරීමෙන් ද අසංකාරික වෙයි. බලවත් වෙයි.

## ද්වේසමූල සිත් 2 කි. 1. **දෝමනස්ස සහගත පටිඝ සම්පයුක්ත අසංඛාරික සිත 2. දෝමනස්ස සහගත පටිඝ සම්පයුක්ත සසංඛාරික සිත**

- ද්වේෂ චෛතසිකය මුලිකවූ සිත්ය.
- දිට්ඨිය හෝ ලෝබය කිසිවිටකත් මේ සමග ඇති නොවේ. දිට්ඨිය කෙළින්ම නොයෙදේ. නමුත් එය වක්‍රව ද්වේෂය ඇතිවිමට හේතුවක් විය හැකිය.
- ප්‍රීතිය නොයෙදෙන බැවින් සෝමනස්ස වේදනාවද සහ උපේක්ෂා වේදනාවද කිසිවිටකත් නොයෙදෙයි. සැමවිටම දොමනස්ස වේදනාව ඇත.
- දෝමනස්ස - දු+මන+අස්ස “දු” දුෂ්ඨ නපුරු අර්ථයි. මෙයද කායික වේදනාවක් නොව මානසික වේදනාවකි.
- පටිඝ/ ව්‍යාපාද ආදී නම්වලින් සඳහන් වන්නේද මෙයයි.
- පටිඝය ආකාර තුනකින් ඉස්මතු වෙයි . එනම් - 1. විරෝධය 2. ප්‍රතික්ෂේපය 3. විනාශ කිරීම
- එපාවීම කනස්සල්ල අප්‍රියබව කෝපය භය මේ සියල්ලම පටිඝයයි.
- අරමුණ හැපෙන්නා සේ ඇතිවන නිසා “පටිඝ” නම්වේ.
- අකුසල කර්මපථ 7ක් ද්වේෂමූල වෙති. එනම්- ප්‍රානඝාත/අදත්තාදන/පරුෂ/මුසා/පිසුන/සම්ප්‍රපලාප/ව්‍යාපාද යන මේවාය.
- පටිඝය වනාහි අනුසය ධර්මයකි./ නීවරන ධර්මයකි /සංයෝජන ධර්මයකි /අකුසල මූලයකි.

## අකුසල සිත් - මෝහ මුල සිත් -2 1. **උපේක්ඛා සහගත විචිකිච්චා සම්ප්‍රයුක්ත සිත 2. උපේක්ඛා සහගත උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත**

* මෝහය යනු මුලාව හෙවත් අනවබෝධයයි. අවිජ්ජාව යනුද මෙයයි.* මෙය අකුසල මූලයකි. සියළු අකුසල් සිත්හි යෙදෙයි. මෙම සිත් දෙකෙහි අනෙකුත් මූල නොයෙදී මොහයම මූලිකවෙති. මෙම සිත් සැමවිටම උපේක්ෂා සහගතයි. විචිකිච්චාව සහ උද්ධච්චය ඇති නිසා.